# කාර්ය සාධන වාර්තාව

## செயலாற்றுகை அறிக்கை

# Performance Report

# 2015

ජාතික අයවැය දෙපාර්තමේන්තුව - මුදල් අමාත්‍යාංශය

தேசிய வரவுசெலவுத் திட்டத் திணைக்களம் - நிதி அமைச்சு

**Department of National Budget – Ministry of Finance**

# කාර්ය සාධන වාර්තාව - 2015

## ජාතික අයවැය දෙපාර්තමේන්තුව

# මුදල් අමාත්‍යාංශය

### දැක්ම

රාජ්‍ය සම්පත් කාර්යක්ෂම ලෙස ප්‍රතිපාදනය හා කළමනාකරණය තුලින්
සමාජ ආර්ථික සංවර්ධනය

### මෙහෙවර

කාර්යක්ෂම රාජ්‍ය සේවයක් පවත්වා ගැනීම සඳහාත්, රජයේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහාත්, අවශ්‍ය සම්පත් ප්‍රතිපාදනය හා බෙදා හැරීම මඟින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳව ව්‍යවස්ථාදායකය වෙත පැවරී ඇති වගකීම නිසි අයුරින් ඉටු කිරීම සඳහා සහාය වීම.

## කාර්යයන් හා වගකීම්

### (අ) ජාතික අයවැය සකස් කිරීම

- වසර තුනක කාලයක් සඳහා මධ්‍යකාලීන වියදම් රාමුව සකස් කිරීම
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත මඟින් දක්වා ඇති මූල්‍ය ඉලක්ක සපුරාගනු වස් වියදම් කිරීමේ ආයතන හා අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමඟ එක් ව රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන සඳහා වාර්ෂික අයවැය ගණනය කිරීම

### (ආ) රාජ්‍ය වියදම් කළමනාකරණය

- අයවැය චක්‍රලේඛ නිකුත් කිරීම.
- අරමුදල් අනුමත සීමාව තුළ ප්‍රකාශිත අරමුණ වෙනුවෙන් ම යොදා ගැනෙන බවට තහවුරු කිරීම සඳහා සුදුසු අයවැය කළමනාකරණ පිළියම් ක්‍රියාත්මක කිරීම.
- වියදම් කාර්යක්ෂමතාව තහවුරු කිරීම පිණිස වියදම් කිරීමේ ආයතන සමග අන්තර් ක්‍රියා කිරීම.
- මූල්‍ය මෙන් ම භෞතික ප්‍රගතිය විමර්ශනය කිරීම සඳහා වියදම් විශ්ලේෂණය කිරීම.
- රාජ්‍ය ගිණුම් කාරක සභාවේ දී ජාතික අයවැය දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම (COPA)
- අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳ නිරීක්ෂණ සැකසීම
- කල්බදු ක්‍රමයට අයත් නොවන වාහන ප්‍රසම්පාදනය සඳහා අවසර ලබාදීම.
- මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ සියළු රාජ්‍ය ආයතන සඳහා වාහන ප්‍රසම්පාදනය
- භාණ්ඩාගාරය/ජාතික අයවැය දෙපාර්තමේන්තුව නියෝජනය කරන මණ්ඩල හා කමිටුවල කාර්ය මණ්ඩල සහභාගිත්වය, හා
- දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය

### (ඇ) ව්‍යවස්ථාපිත ආයතන සම්බන්ධ ක්‍රියාකාරකම් (වාණිජ නොවන රාජ්‍ය ආයතන)

ඒකාබද්ධ අරමුදලින් සහාය දක්වෙන ව්‍යවස්ථාපිත ආයතන සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම.

පොදු ව්‍යාපාර කාරක සභාවේ දී ජාතික අයවැය දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම (COPE).

### (ඈ) අත්තිකාරම් ගිණුම් කටයුතු

- වාණිජ, ගබඩා හා රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සඳහා වියදම් කිරීමේ ආයතන හා සාකච්ඡා කර සීමා නිර්ණය කිරීම හා සීමා වෙනස් කිරීම සඳහා වූ ඉල්ලීම් සලකා බැලීම.
- අත්තිකාරම් ගිණුම්වලට අදාළ කරුණු පිළිබඳ පොදු ගිණුම් කාරක සභාවේ දී භාණ්ඩාගාරය නියෝජනය කිරීම.

## පටුන


| පරිච්ඡේද අංකය | | විෂයය | පිටුව |
|---|---|---|---|
| **01.** | | **සමාලෝචනය** | **01** |
| **02.** | | **2015 අයවැය විමර්ශනය හා ක්‍රියාත්මක කිරීම** | **04** |
| | 2.1 | 2015 සඳහා විසර්ජන පනත | 04 |
| | 2.2 | අවිනිශ්චිත අවස්ථා අරමුදල භාවිතය | 05 |
| | 2.3 | 2015 අයවැයෙහි කාර්යසාධනය | 05 |
| | 2.3.1 | 2015 අංක 1 දරණ විසර්ජන (සංශෝධන) පනත | 05 |
| | 2.4 | මධ්‍යකාලීන වියදම් රාමුව 2015-2017 තුළ 2015 අයවැයෙහි ආංශික දැක්ම | 08 |
| | 2.5 | 2015 අයවැය කළමනාකරණය | 08 |
| | 2.5.1 | මුළු රාජ්‍ය වියදම | 08 |
| | 2.5.2 | රාජ්‍ය වියදම් කළමනාකරණය | 08 |
| | 2.5.2.1 | අරමුදල් මාරු කිරීම | 08 |
| | 2.5.2.2 | පරිපූරක ඇස්තමේන්තු | 09 |
| | 2.5.2.3 | 2015 වසරේ පරිපූරක සහාය සේවා සහ හදිසි වගකීම් ව්‍යාපෘතියෙහි තත්ත්වය | 09 |
| | 2.5.3 | අයවැය චක්‍රලේඛ නිකුත් කිරීම | 09 |
| | 2.6 | අත්තිකාරම් ගිණුම් විමර්ශනය | 10 |
| **03.** | | **2016 සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම** | **10** |
| | 3.1 | අයවැය සකස් කිරීමේ මාර්ගෝපදේශ | 10 |
| **04.** | | **විශේෂ ක්‍රියාකාරකම්** | **11** |
| | 4.1 | වාණිජ නොවන රාජ්‍ය ආයතනවල අයවැය කළමනාකරණය | 11 |
| | 4.2 | අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳ නිරීක්ෂණ | 11 |
| | 4.3 | වාහන මිලදී ගැනීම සඳහා අනුමැතිය | 11 |
| | 4.3.1 | වාහන ප්‍රසම්පාදනය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙහි අනුමැතිය | 11 |
| | 4.3.2 | රාජ්‍ය අංශය සඳහා වාහන ප්‍රසම්පාදනය | 12 |
| | 4.4 | මණ්ඩල හා කමිටුවල කාර්ය මණ්ඩල සහභාගිත්වය | 12 |
| **05.** | | **ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය හා කාර්ය භාරය** | **12** |
| | 5.1 | කාර්ය මණ්ඩලය | 13 |
| | 5.2 | මානව සම්පත් සංවර්ධනය | 13 |
| | 5.2.1 | විදේශ පුහුණු/සම්මන්ත්‍රණ/රැස්වීම් | 13 |
| | 5.2.2 | දේශීය පුහුණු | 14 |
| | 5.3 | ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය | 15 |
| | 5.3.1 | අත්තිකාරම් ගිණුම් කටයුතු | 15 |
| | 5.3.2 | 2015 සඳහා විගණකාධිපතිගේ විමසුම් | 16 |
| | 5.4 | සංවිධාන ව්‍යුහය | 17 |

## සමාලෝචනය

ජාතික අයවැය දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ක්‍රියාත්මක වන අතර, අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ කේන්ද්‍රීය ආයතනය ලෙස කටයුතු කරයි. නව රජයේ ප්‍රතිපත්ති වෙනස් වීම් සඳහා පහසුකම් සැපයීම පිණිස ශුන්‍ය පාදක අයවැය ප්‍රවේශය හඳුන්වා දෙමින් හා දින සියයේ විප්ලවය වැඩසටහනට ඉඩ සලසමින් වත්මන් වැඩසටහන් වල කාර්ය සාධන මට්ටම හා අරමුදල් සැපයීම යුක්තිසහගත කරන්නා වූ ක්‍රමවත් සමාලෝචනයක් මගින් සම්පත් නැවත වෙන් කිරීමට විශ්වාසනීය තාර්කිකත්වයක් ගොඩ නගමින් ජාතික අයවැය නැවත සකස් කරන ලදී. මේ ක්‍රියාවලියට රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රජයේ ව්‍යවස්ථාපිත ආයතන හා අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමඟ අඛණ්ඩ සාකච්ඡා පැවැත්වීමක් ඇතුළත් වේ.

මෙම දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල කාර්ය සාධනය, මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුළුල් විෂය පථය හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට පැවරුණු රාජකාරිය මත පදනම් වේ. 2015 වසරේ දී 1.1 වගුවෙහි දැක්වෙන පරිදි 2015 අයවැය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මෙන් ම ශුන්‍ය පාදක අයවැය ප්‍රවේශය හා මධ්‍යකාලීන වියදම් රාමුව 2016-2018 සමග 2016 අයවැය සැකසීමට අදාළ කටයුතු ගණනාවක් ද දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

### 1.1 වගුව - කාර්ය සාධනයේ සාරාංශය - 2015

| කාර්යය | ක්‍රියාකාරකම | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| 1. 2015 අයවැය ක්‍රියාත්මක කිරීම හා වියදම් පාලනය. | වියදම් පාලනය පිළිබඳ උපදෙස් ලබාදෙමින් චක්‍රලේඛ නිකුත් කිරීම | රාජ්‍ය වියදම් කාර්යක්ෂම ලෙස කළමනාකරණය | මේ සම්බන්ධව අංක 2/2015 දරණ ජාතික අයවැය චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| | කලින් සැලසුම් නොකල වියදම් වෙනුවෙන් අමතර ප්‍රතිපාදන ලබාදීම හා පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | කලින් සැලසුම් නොකල වියදම් අවම කරගනිමින් අරමුදල් සැපයීම | ගංවතුර, නියඟ වැනි පෙර නොදක්නා ලද අවස්ථාවන් සඳහා වන වියදම් පියවා ගැනීමට පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකර, අනුමත වියදම් රාමුව තුල පවතින ප්‍රතිපාදන නැවත වෙන්කිරීම මගින් එම අමතර අරමුදල් අවශ්‍යතා සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලදී. |
| | මු.රෙ.66 හා 69 යටතේ අරමුදල් මාරු කිරීම සඳහා අවසරය ලබාදීම | අනුමත ඇස්තමේන්තුව තුල වියදම් පවත්වා ගැනීම. | මුදල් රෙගුලාසි අනුව ඉල්ලීම් 1243 සඳහා අවසර ලබාදෙන ලදී. ඒ අතරින් 220ක් වැඩසටහන් අතර මාරු කිරීම වූ අතර, 1,023ක් ව්‍යාපෘති අතර මාරු කිරීම් විය. |

| කාර්යය | ක්‍රියාකාරකම | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | 2014 අංක 41 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම | නව රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට හැකිවන අයුරින් 2015.01.18 දිනැති 1897/15 දරන ගැසට් නිවේදනය මගින් ස්ථාපනය කරන ලද නව අමාත්‍යාංශවලට අවශ්‍ය වූ අයවැය ප්‍රතිපාදන ඒ වනවිට අනුමතව තිබූ ප්‍රතිපාදන නැවත වෙන්කිරීම තුලින් සලසා දීම.<br><br>2015 ජනවාරි අග සතියේ හදිසි පනතක් ලෙස විසර්ජන පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. | 2015.02.07 වන දින 2015 අංක 01 දරන විසර්ජන (සංශෝධන) පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කරගන්නා ලදී.<br><br>2015.02.07 වන දින 2015 අංක 01 දරන විසර්ජන පනත ගරු කතානායකතුමන් විසින් සහතික කරන ලදී.<br><br>2015.02.11 දින මුදල් අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍ර නිකුත් කරන ලදී. |
| | 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධනය වූ 2014 අංක 41 දරන විසර්ජන පනත යළි සංශෝධනය කිරීම. | 2015.01.18 දිනැති 1897/15 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ස්ථාපනය කරන ලද නව අමාත්‍යාංශවලට සමාන්තරව අයවැය ප්‍රතිපාදන නැවත සකස් කිරීම මගින් රජයේ ක්‍රියාකාරකම් බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සලසා, ගිණුම්කරණ ගැටළු අවම කිරීම.<br><br>2015 නොවැම්බර් පළමු සතියේ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.<br><br>විසර්ජන පනත පාර්ලිමේන්තුව මගින් සම්මත කිරීම | 2015.10.23 දිනැති ගැසට් පත්‍රයෙහි විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත පළකිරීම.<br><br>2015.11.06 වන දින විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.<br><br>2015.11.23 වන දින අයවැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. (දෙවන වර කියවීම)<br><br>2015.11.26 වන දින විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.<br><br>2015.12.03 වන දින 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත ගරු කතානායකතුමන් විසින් සහතික කරන ලදී.<br><br>2015.12.07 දින මුදල් අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍රය නිකුත් කරන ලදී. |
| 2. 2016 සඳහා ජාතික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම. | අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා අයවැය මාර්ගෝපදේශ නිකුත් කිරීම. | අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා ශුන්‍ය පාදක අයවැයකරණය පිළිබඳ මාර්ගෝපදේශ සහිතව අයවැය කැඳවුමක් නිකුත් කිරීම. | ශුන්‍ය පාදක අයවැය ප්‍රවේශය හා මධ්‍යකාලීන වියදම් රාමුව 2016-2018 තුළ රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අනුගත වෙමින් 2016 අයවැය සකසන ලදී. |
| | භාණ්ඩාගාරයේ අදාළ දෙපාර්තමේන්තු හා වියදම් කිරීමේ ආයතන සමග සාකච්ඡා කර වාර්ෂික අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් සැකසීම. | රජයේ ඉලක්ක සපුරා ගැනීම තහවුරු කිරීම. | ගරු මුදල් අමාත්‍යතුමාගේ හා අදාළ අමාත්‍යාංශයේ ගරු අමාත්‍යවරුන්ගේ සභාපතිත්වයෙන් තෝරාගත් අමාත්‍යාංශ හා පාර්ශ්වකරුවන් අතර අයවැය පූර්ව සාකච්ඡා පවත්වන ලදී.<br><br>භාණ්ඩාගාර ලේකම්, |
| | අදාළ අමාත්‍යාංශ සමග අයවැය සාකච්ඡා පැවැත්වීම | සැබෑ අවශ්‍යතා හඳුනාගෙන යථාර්තවාදී අයවැයක් | |

| කාර්යය | ක්‍රියාකාරකම | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | | සැකසීම. | නියෝජ්‍ය ලේකම්වරු හා අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමග ආයතන අතර සමාලෝචන සාකච්ඡා පවත්වන ලදී. |
| | 2016 සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත නියමිත දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීම. | 2015 ඔක්තෝබර් අග සතියේ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.<br><br>විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවෙන් සම්මත කිරීම.<br><br>විස්තරාත්මක ඇස්තමේන්තු මුද්‍රණය කිරීම. | 2015.10.09 දිනැති ගැසට් පත්‍රයෙහි 2015 සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත පළකිරීම.<br><br>2015.10.23 වන දින විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.<br><br>2015.11.20 වන දින අයවැය දෙවන වර කියවීම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.<br><br>2015.12.19 වන දින විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් සම්මත කර එය 2015 අංක 16 දරන විසර්ජන පනත ලෙස ගරු කතානායකතුමන් විසින් සහතික කරන ලදී.<br><br>2015.12.21 දින මුදල් අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍රය නිකුත් කරන ලදී.<br><br>අදාළ සියළු වියදම් කිරීමේ ආයතන සැළකිල්ලට ගෙන පසුබිම් තොරතුරු ඇතුලත්ව විස්තරාත්මක ඇස්තමේන්තු මුද්‍රණය කරන ලදී. |
| 3. අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳ නිරීක්ෂණ ලබාදීම. | අදාළ රාජ්‍ය/ආංශික ප්‍රතිපත්ති හා වියදම් පිළිබඳ විශ්ලේෂණ අධ්‍යයනය කරමින් අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ නියමිත දිනට ලබාදීම. | අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳ නිරීක්ෂණ නියමිත දිනට ඉදිරිපත් කිරීම. | අමාත්‍ය මණ්ඩල සංදේශ 245ක් සඳහා නිරීක්ෂණ ලබාදෙන ලදී. |
| 4. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කළමනාකරණය. | සාමාන්‍ය පරිපාලනය<br><br>මුල්‍ය කල්බදු වාහන කළමනාකරණය | • මානව සම්පත් හා දෙපාර්තමේන්තුවට වෙන් කර ඇති අයවැය දෙපාර්තමේන්තුවට වෙන්කර ඇති අයවැය ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස යොදා ගැනීම. | රු.මිලියන 6,901.9 ක ප්‍රතිපාදන එනම්, රු.මිලියන 2,350.2ක පුනරාවර්තන වියදම් හා රු.මිලියන 4,551.7ක ප්‍රාග්ධන වියදම් යොදා ගන්නා ලදී. එයින් රු.මි.2,511.89 ක් මුල්‍ය කල්බදු ගෙවීම සඳහා භාවිතා කරන ලදී. |
| | දෙපාර්තමේන්තු අත්තිකාරම් ගිණුම් පාලනය | • අත්තිකාරම් ගිණුම්වල සීමාවන්ට අනුකූලව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සියළු අයදුම්කරුවන්ට ණය/අත්තිකාරම් ලබාදීම. | අනුමත සීමාවන්ට යටත්ව,රු.5,275,649 ආපදා ණය, පාපැදි ණය, විශේෂ අත්තිකාරම් හා උත්සව අත්තිකාරම් ලබාදෙන ලදී. |

| කාර්යය | ක්‍රියාකාරකම | සමස්ත ඉලක්කය | කාර්ය සාධනය |
|---|---|---|---|
| | හැකියා වර්ධනය | දේශීය හා විදේශීය පුහුණු මගින් මානව සම්පත් සංවර්ධනය කිරීම | ජාතික අයවැය දෙපාර්තමේන්තු ක්‍රියාකාරකම්වලට අදාළ වැඩසටහන් පිළිබඳව නිලධාරීන් 09 දෙනෙක සඳහා විදේශ පුහුණුව හා නිලධාරීන් 05 දෙනෙකු සඳහා දේශීය පුහුණු අවස්ථා ලබාදෙන ලදී. |
| | වාර්තා ලබාදීම | • අවසන් දිනට පෙර වාර්තා ලබාදීම<br>'අ' විසර්ජන ගිණුම<br>'ආ' රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සැසඳීම | 'අ'විසර්ජන ගිණුම 2015<br>'ආ' රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සැසඳීම 2015<br>යන වාර්තා නියමිත දිනට ලබාදෙන ලදී. |
| | විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම | විගණන විමසුම් අවම කිරීම<br><br>රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහභාගී වීම. | විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් එවන ලද සියළු විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදී ඇත. (විගණන විමසුම් 12) |

## 2. 2015 අයවැය විමර්ශනය හා ක්‍රියාත්මක කිරීම

### 2.1 2015 සඳහා විසර්ජන පනත

2015 සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත 2014 සැප්තැම්බර් 26 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර, 2014 නොවැම්බර් 24 වන දින එය 2014 අංක 41 දරන විසර්ජන පනත වශයෙන් සම්මත විය. ඒ අනුව, 2015 සඳහා අත්තිකාරම් ගිණුම් කටයුතු ඇතුළුව රජයේ ඇස්තමේන්තුගත මුළු වියදම රු.බිලියන 3,409ක් විය.

එසේ වුවද, 2015 ජනවාරි පැවති ජනාධිපතිවරණයෙන් අනතුරුව අමාත්‍යාංශ විෂය පථයන් වෙනස් වූ අතර, රජයේ නව ප්‍රතිපත්ති සැලසුම් දින 100 වැඩපිළිවෙල ඔස්සේ හඳුන්වා දෙන ලදී. මේ ප්‍රතිපත්තීන් සඳහා ඉඩ සලසනු පිණිස 2014 අංක 41 දරණ විසර්ජන පනත සංශෝධනය කළ අතර, නව වැය ශීර්ෂ අනුව අයවැය ප්‍රතිපාදන නැවත සලසා දෙනලදී. ඒ අනුව, සකසන ලද පනත් කෙටුම්පත 2015 ජනවාරි 29 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර, 2015 පෙබරවාරි 07 වන දින 2015 අංක 1 දරණ විසර්ජන (සංශෝධන) පනත වශයෙන් සම්මත විය. එහි අත්තිකාරම් ගිණුම් කටයුතු ඇතුළුව, 2015 වර්ෂය සඳහා රජයේ ඇස්තමේන්තුගත මුළු වියදම වූ රු.බිලියන 2,172ක් විය. අයවැය හිඟය අඩු කිරීමේ අදහස ඇතිව පළමු උපලේඛනයෙහි සඳහන් වියදම රු.බිලියන 2,172 සිට රු.බිලියන 2,101 වශයෙන් වෙනස් කරන ලද අතර සෙසු උපලේඛන වෙනස් නොවීය.

2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) පනත අනුව රජයේ මුළු වියදම පහත පරිදි වේ.

| | |
|---|---|
| • රජයේ සාමාන්‍ය සේවාවලට අදාළ වියදම | රු.බිලියන 2,101 |
| • විශේෂ නීති මගින් රජයට පැවරෙන හා ඒකාබද්ධ අරමුදලින් දැරිය යුතු වියදම | රු.බිලියන 1,237 |
| • අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධ වියදම | රු.බිලියන 4.0 |

2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) පනත පාර්ලිමේන්තුවෙන් අනුමත කර පැවති ප්‍රතිපාදන නැවත වෙන් කිරීම තුලින් රජයේ කටයුතු බාධාවකින් තොරව සිදුවූ අතර, තවදුරටත් පැවති ගිණුම්කරණ ගැටළු අවම කරගැනීම පිණිස 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත වශයෙන් එය 2015 නොවැම්බර් 25 දින නැවත සංශෝධනය කෙරුණි. මේ සංශෝධනය යටතේ

රජයේ ඇස්තමේන්තුගත මුළු වියදම හා අයවැය හිඟය 2015 අංක 1 දරන විසර්ජන (සංශෝධන) පනතෙහි තිබූ පරිදිම නොවෙනස්ව පැවතිණි.

## 2.2 අවිනිශ්චිත අවස්ථා අරමුදල භාවිතය

2015 අප්‍රේල් 06 දින නිකුත් කරන ලද 1909/20 හා 2015 අප්‍රේල් 10 දින නිකුත් කරන ලද 1909/54 අතිවිශේෂ ගැසට් නිවේදන මගින් මුළු අමාත්‍යාංශ සංඛ්‍යාව 30 සිට 41 දක්වා ඉහළ දැමිණ. එම අමාත්‍යාංශ 11 සඳහා වැය ශීර්ෂ නොතිබූ බැවින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 151(2) වගන්තිය යටතේ අන්තර් කාලීන පිළියමක් ලෙස එක් අමාත්‍යාංශයකට රු.මිලියන 5 බැගින් අවිනිශ්චිත අවස්ථා අරමුදලින් ලබාදෙන ලදී.

## 2.3 2015 අයවැයෙහි කාර්ය සාධනය

අයවැය කතාව සමග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වියදම් ශීර්ෂ අනුව, එනම් ව්‍යාපෘති, වැය ඒකක සහ වියදම් මූල්‍යනය කරනු ලබන මූලාශ්‍ර ඇතුලත්ව සකස් කරන ලද මුද්‍රිත ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලදී. විසර්ජන පනත් කෙටුම්පත පනතක් බවට පත්වූ පසුව මුද්‍රිත ඇස්තමේන්තුවල දැක්වෙන වියදම් දැරීම සඳහා බලය ලබාදෙමින් මුදල් අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍රයක් නිකුත් කරන ලදී. 2015 වසර සඳහා පාර්ලිමේන්තුවෙන් අනුමත කරන ලද අයවැය ඇස්තමේන්තු තුල වැය ශීර්ෂ/වැය ඒකක 189ක් සඳහා ප්‍රතිපාදන වෙන් කෙරුණු අතර, එහි විශේෂ වැය ඒකක 19, අමාත්‍යාංශ 50ක් හා දෙපාර්තමේන්තු 120 ක් ඇතුලත් විය.

### 2.3.1 2015 අංක 1 දරණ විසර්ජන (සංශෝධන) පනත

2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත අනුව, 2015 සඳහා ඇස්තමේන්තුගත මුළු වියදම රු.බිලියන 3,203ක් වූ අතර, ඉන් රු.බිලියන 1,849ක් හෝ සියයට 58ක් විසර්ජන පනත අනුව වූ අතර, රු.බිලියන 1,354ක් හෝ සියයට 42ක් විශේෂ නීති සේවා යටතේ සහ ඉතිරි රු.බිලියන 4 අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා විය. 2015 සඳහා වාර්තා වූ මුළු වියදමෙන් විසර්ජන (සංශෝධන) පනතේ පළමු උපලේඛනය යටතේ දැක්වුණු රජයේ සාමාන්‍ය සේවා සඳහා වූ ප්‍රතිපාදන රු.බිලියන 1,849ක් වූ අතර, 2014ට සාපේක්ෂව එය රු.බිලියන 320ක හෝ සියයට 21ක වැඩිවීමකි. මෙයට වැටුප් හා වේතන, විදුලිය, ජලය, ලිපිද්‍රව්‍ය, ඉන්ධන,ආහාර, නිල ඇඳුම් වැනි සුභසාධන කටයුතු හා සංවර්ධන වැඩසටහන් ආදී ප්‍රාග්ධන හා පුනරාවර්තන යන වියදම් දෙකම අයත් වේ. විශේෂ නීති සේවා සඳහා ඇස්තමේන්තුගත වියදම රු.බිලියන 1,237ක් වුවද, සැබෑ වියදම රු.බිලියන 1,354ක් විය. විශ්‍රාම වැටුප් සංශෝධනය හා පොලී ගෙවීම් ඉහළ දැමීම මෙම වියදමේ වැඩිවීමට දායක වී ඇත. විශේෂ නීති සේවා සඳහා සම්පූර්ණ ප්‍රතිපාදන යොදා ගැනීම 2014 දී රු.බිලියන 1,073ට සාපේක්ෂව 2015 දී එය රු.බිලියන 117.5කින් (සියයට 11) වැඩි වී ඇත.

රු.මි
.

| අමාත්‍යාංශයේ නම | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන | භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂය මගින් ලබාදුන් අතිරේක ප්‍රතිපාදන | විශේෂ වොරන්ට් බලපත්‍ර මගින් ලබාදුන් පරිපූරක ප්‍රතිපාදන | මුළු ප්‍රතිපාදන ((1)+(2)+(3) හි එකතුව) | සත්‍ය වියදම | උපයෝජනය කළ ප්‍රතිපාදන (4)-(5) |
|---|---|---|---|---|---|---|
| | (1) | (2) | (3) | (4) | (5) | (6) |
| 1-22 විශේෂ වියදම් ඒකක | 14,843 | 588 | 1 | 15,433 | 13,771 | 1,662 |
| බුද්ධශාසන | 1,517 | 372 | | 1,889 | 1,814 | 75 |
| මුදල් | 76,187 | 56,482 | | 132,669 | 121,002 | 11,667 |
| ආරක්ෂක | 294,177 | 13,967 | | 308,144 | 296,787 | 11,357 |
| ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු | 11,836 | 8,030 | 3 | 19,870 | 14,910 | 4,959 |
| ආපදා කළමනාකරණ | 4,065 | 40 | | 4,105 | 2,845 | 1,260 |
| තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික | 12,242 | 8 | | 12,250 | 12,237 | 13 |

රු.මි.

| අමාත්‍යාංශයේ නම | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන | භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂය මගින් ලබාදුන් අතිරේක ප්‍රතිපාදන | විශේෂ වොරන්ට් බලපත්‍ර මගින් ලබාදුන් පරිපූරක ප්‍රතිපාදන | මුළු ප්‍රතිපාදන ((1)+(2)+(3) හි එකතුව) | සත්‍ය වියදම | උපයෝජනය කළ ප්‍රතිපාදන (4)-(5) |
|---|---|---|---|---|---|---|
| කටයුතු | | | | | | |
| අධිකරණ | 9,276 | 42 | | 9,318 | 8,000 | 1,318 |
| සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය | 148,184 | 1,722 | | 149,906 | 130,896 | 19,011 |
| විදේශ කටයුතු | 9,783 | 323 | | 10,106 | 8,544 | 1,562 |
| ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා | 79,683 | 10,351 | | 90,034 | 68,783 | 21,251 |
| උසස් අධ්‍යාපන හා මහාමාර්ග | 230,629 | 11,540 | | 242,169 | 222,136 | 20,033 |
| කෘෂිකර්ම | 52,096 | 17,212 | | 69,308 | 67,349 | 1,959 |
| විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති | 1,420 | 7,816 | | 9,236 | 7,910 | 1,326 |
| කාන්තා හා ළමා කටයුතු | 4,843 | 525 | | 5,368 | 4,465 | 903 |
| ස්වදේශ කටයුතු | 43,645 | 2,353 | | 45,998 | 41,283 | 4,715 |
| පාර්ලිමේන්තු කටයුතු හා ජනමාධ්‍ය | 5,708 | 60 | | 5,768 | 3,508 | 2,260 |
| නිවාස හා ඉදිකිරීම් | 5,602 | 1,335 | | 6,937 | 6,821 | 116 |
| සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන | 78,273 | 6,226 | | 84,500 | 81,308 | 3,192 |
| අධ්‍යාපන | 62,134 | 912 | | 63,046 | 60,446 | 2,600 |
| රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ | 160,541 | 16,652 | 12,500 | 189,692 | 182,174 | 7,519 |
| වැවිලි කර්මාන්ත | 16,101 | 179 | | 16,280 | 15,016 | 1,264 |
| ක්‍රීඩා | 4,048 | 12 | | 4,059 | 3,334 | 725 |
| උඩරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන | 1,146 | - | | 1,146 | 1,057 | 90 |
| පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීමේ හා හින්දු ආගමික කටයුතු | 7,025 | 4 | | 7,029 | 2,159 | 4,870 |
| කර්මාන්ත හා වානිජ | 6,243 | 190 | | 6,433 | 4,977 | 1,456 |
| ඛනිජ තෙල් සම්පත් සංවර්ධන | 360 | 4,484 | | 4,844 | 4,744 | 100 |
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන | 6,081 | 122 | | 6,203 | 5,034 | 1,169 |
| ඉඩම් | 7,793 | 48 | | 7,841 | 7,246 | 595 |
| ග්‍රාමීය ආර්ථික කටයුතු | 19,358 | 134 | | 19,492 | 12,929 | 6,563 |
| පළාත් පාලන හා පළාත් සභා | 285,858 | 12,577 | | 298,435 | 226,995 | 71,440 |
| ජාතික සංවාද | 725 | 4 | | 729 | 535 | 193 |
| රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන | 1,028 | 179 | | 1,207 | 1,190 | 17 |

රු.මි.

| අමාත්‍යාංශයේ නම | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන | භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂය මගින් ලබාදුන් අතිරේක ප්‍රතිපාදන | විශේෂ වොරන්ට් බලපත්‍ර මගින් ලබාදුන් පරිපූරක ප්‍රතිපාදන | මුළු ප්‍රතිපාදන ((1)+(2)+(3) හි එකතුව) | සත්‍ය වියදම | උපයෝජනය කළ ප්‍රතිපාදන (4)-(5) |
|---|---|---|---|---|---|---|
| සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු | 293 | 25 | | 319 | 211 | 107 |
| මහවැලි සංවර්ධන හා පරිසර | 39,683 | 365 | | 40,048 | 32,351 | 7,697 |
| තිරසර සංවර්ධන හා වනජීවී | 3,004 | 348 | | 3,352 | 3,192 | 160 |
| මහානගර හා බස්නාහිර සංවර්ධන | 18,032 | 176 | | 18,208 | 7,615 | 10,594 |
| අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු | 8,001 | - | | 8,001 | 4,385 | 3,616 |
| දක්ෂිණ සංවර්ධන | 56 | - | | 56 | 39 | 17 |
| ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන | 33 | - | | 33 | 7 | 26 |
| නගර සැලසුම් හා ජල සම්පාදන | 15,153 | 24,428 | | 39,581 | 30,437 | 9,144 |
| වරාය හා නාවික | 2,228 | - | | 2,228 | 215 | 2,013 |
| විදේශ රැකියා | 1,146 | - | | 1,146 | 963 | 182 |
| නීතිය හා සාමය හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ | 72,021 | 595 | | 72,616 | 68,247 | 4,369 |
| කම්කරු හා වෘත්තීය සමිති සබඳතා | 3,292 | 439 | | 3,731 | 3,516 | 215 |
| විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් | 1,441 | - | | 1,441 | 859 | 582 |
| සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ | 776 | 1 | | 776 | 597 | 179 |
| විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ | 3,724 | 33 | | 3,757 | 3,148 | 609 |
| නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු | 10,692 | 71 | | 10,763 | 8,367 | 2,396 |
| වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ | 20,341 | 271 | | 20,612 | 22,338 | (1,726) |
| ප්‍රාථමික කර්මාන්ත | 981 | 53 | | 1,034 | 998 | 36 |
| **ණය සේවා ගෙවීම්** | **1,265,000** | **-** | **124,907** | **1,389,907** | **1,373,593** | **16,314** |
| **භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂය** | **209,656** | **(201,296)** | **-** | **8,360** | **-** | **8,360** |
| **මුළු එකතුව** | **3,338,000** | **-** | **137,411** | **3,475,411** | **3,203,280** | **272,131** |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව/රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව*

### 2.4 මධ්‍යකාලීන වියදම් රාමුව 2015-2017 තුළ 2015 අයවැයෙහි ආංශීය දැක්ම

2015 අයවැය ප්‍රධාන වශයෙන් රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව හා එහි උපාය මාර්ගික අනන්‍යතා මත පදනම්ව ඇත. පහත අයුරින් වන මෙහෙයුම් දැක්මද 2015 අයවැය සකස් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී යොදා ගැනිණි.

(අ) ආංශයීය පදනම - ඒ ඒ ක්ෂේත්‍රයෙහි සංවර්ධනය සඳහා පාර්ශ්වකරුවන් විසින් නිර්ණය කරන ලද ආංශික ප්‍රතිපත්ති රාමු අනුව 2015 අයවැයෙහි අයවැය ප්‍රතිපාදන නිර්මාණය කරන ලදී.

(ආ) තාත්වික තක්සේරුව - 2015 අයවැය ව්‍යවස්ථාවෙහි 150(2) හා 150(3) වගන්ති මගින් දක්වෙන සීමා යටතේ වූ සැබෑ වියදම් තක්සේරුවක් මත පදනම් විය.

(ඇ) ක්‍රියාත්මක නොවන ව්‍යාපෘති - අවුරුදු කිහිපයක් පුරා ඇස්තමේන්තුවල පවතින එවැනි ව්‍යාපෘති නැවත සකස් කිරීම හෝ වෙනස් කිරීම.

(ඈ) ද්විකරණය හා අතිපිහිතවීම වැළැක්වීම - තනි අමාත්‍යාංශවල අන්තර්පරායත්ත හා දෙපාර්තමේන්තු කිහිපයක් විසින් සිදු කරන ක්‍රියාකාරකම් පිළිබඳ නිසි හඳුනා ගැනීමක් සිදුවිය. ව්‍යාපෘති හා වැඩසටහන් යටතේ ක්‍රියාත්මක සමාන ක්‍රියාකාරකම් සඳහා ආංශික ප්‍රතිපාදන නිසි පරිදි බෙදී යන බව තහවුරු කරන ලෙස වියදම් කරන ආයතන හා පළාත් පාලන ආයතන වෙත මාර්ගෝපදේශ ලබාදෙන ලදී.

### 2.5 2015 අයවැය කළමනාකරණය

#### 2.5.1 මුළු රාජ්‍ය වියදම

2015 දී මුළු රාජ්‍ය වියදම රු.බිලියන 3,203ක් වූ අතර, ඉන් සියයට 52.2ක් හෝ රු.1,673ක් පුනරාවර්තන වියදම් ද, සියයට 21.3 නැතහොත් රු.බිලියන 684ක් ප්‍රාග්ධන වියදම් විය. 2015 සඳහා රාජ්‍ය ණය ආපසු ගෙවීමට සියයට 26.4ක් නැතහොත් රු.බිලියන 846ක් විය. 2014 දී රු.බිලියන 2,602 ක්වූ වියදම 2015 දී සියයට 23කින් නැතහොත් රු.බිලියන 601කින් වැඩි විය. කෙසේ වෙතත්, 2015 මුළු වියදම, ඇස්තමේන්තුගත මුදල වූ රු.බිලියන 3,338ට වඩා අඩු විය. එහෙත්, පෙර වසරට සාපේක්ෂව පුනරාවර්තන වියදම් රු.බිලියන 303කින් නැතහොත් සියයට 22.1කින් වර්ධනය වී ඇත.

#### 2.5.2 රාජ්‍ය වියදම් කළමනාකරණය

මධ්‍යකාලීන වියදම් රාමුව වන 2015-2017හි ඉලක්ක සපුරා ගැනීම තහවුරු කරමින් පාර්ලිමේන්තුව විසින් අනුමත වියදම් සීමාව තුළ 2015 වසර සඳහා වූ අයවැය මෙහෙයුම් කළමනාකරණය කරන ලදී.

##### 2.5.2.1 අරමුදල් මාරු කිරීම

සංශෝධනය කරන ලද 2014 අංක 41 දරන විසර්ජන පනතෙහි 5 කොටස අනුව පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද මුළු වියදම් සීමාව තුල භාවිතා නොකරන ලද ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 65 හා 66 හි සඳහන් කාර්ය පටිපාටිය හා සීමා අනුව නැවත වෙන් කිරීම හෝ මාරු කිරීම හෝ කළ හැකිය. මේ ක්‍රියාවලියේදී භාවිතා නොකරන ලද හෝ භාවිතා නොකිරීමට ඉඩ ඇති පුනරාවර්තන වියදම් සමාන වැඩසටහනෙහි ම පුනරාවර්තන හෝ ප්‍රාග්ධන ප්‍රතිපාදන සඳහා හෝ එකම ශීර්ෂය යටතේ ඇති වැඩසටහන්වල පුනරාවර්තන හෝ ප්‍රාග්ධන හෝ වියදම් සඳහා මාරු කිරීමට හැකිය. එලෙසම, භාවිතා නොකරන ලද ප්‍රාග්ධන වියදම් සමාන වැඩසටහන තුල ප්‍රාග්ධන වියදම් සඳහා මාරු කළහැකිය. ඒ අනුව, 2015 වර්ෂයේදී ප්‍රතිපාදන මාරු කිරීම් 1,243ක් සඳහා අනුමැතිය ලබාදෙන ලදී. එයින් 220ක් වැඩසටහන් අතර මාරු කිරීම් හා 1,023ක් ව්‍යාපෘති අතර මාරු කිරීම් විය.

#### 2.5.2.2 පරිපූරක ඇස්තමේන්තු

වසර සඳහා ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේදී පෙර නොදක්නා ලද හා හදිසියේ මතුවන වියදම් කළමනාකරණය කරගැනීම සඳහා පරිපූරක අයවැය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම වැළැක්වීමට භාණ්ඩාගාරය විසින් භාවිතා කරන ප්‍රධාන මෙවලම වන්නේ පරිපූරක සහායක සේවා හා අවිනිශ්චිත අවස්ථා වගකීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමයි (භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂය). මෙම ව්‍යාපෘතිය තුලින් පෙර නුදුටු හා හදිසි වියදම් වෙනුවෙන් අරමුදල් ලබාදෙන අතර, හදිසි පරිපූරක අයවැය ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම වලක්වාලනු ලැබේ. රාජ්‍ය වියදම්වල ඓතිහාසික ප්‍රවණතා ද සැළකිල්ලට ගනිමින් රටෙහි යහපත් මූල්‍ය පරිසරයක් නිර්මාණය කරනු වස් භාණ්ඩාගාරය විසින් මෙම මෙවලම සඳහා ප්‍රතිපාදන වාර්ෂිකව වෙන්කරනු ලැබේ.

#### 2.5.2.3 2015 භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂයේ තත්ත්වය

2014 අංක 41 දරන විසර්ජන පනත මගින් මෙම ව්‍යාපෘතිය සඳහා මූලිකව රු.බිලියන 446ක් වෙන් කරන ලදී. කෙසේ වෙතත්, ජනාධිපතිවරණයෙන් පසු සිදු වූ අමාත්‍යාංශ වෙනස් වීමත් සමගම සිදුකරන ලද ප්‍රතිව්‍යුහගත කිරීම තුලින් මෙකී ප්‍රතිපාදනය රු.බිලියන 457.64 දක්වා වැඩි විය.

2015 දෙසැම්බර් 03 වන දින සිදුකරනු ලැබූ සංශෝධන හා එතුලින් වෙනත් ශීර්ෂවලට ලබා දුන් ප්‍රතිපාදන ඉවත් වූ පසුව මෙහි මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු.බිලියන 209.65ක් දක්වා අඩුවිය. මෙම ප්‍රතිපාදනවලින් රු.බිලියන 201.29ක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද අවශ්‍යතා තක්සේරුව අනුව අදාළ ආයතනවලට පරිපූරක ප්‍රතිපාදන ලෙස නැවත වෙන්කරන ලද ප්‍රමාණයයි. මෙම සියළු පරිපූරක වෙන්කිරීම් 2015 අයවැය ඇස්තමේන්තුවල දක්වා ඇති මාර්ගෝපදේශවලට සමගාමීව සිදුකර ඇත.

ඒ අනුව, 2015 දෙසැම්බර් 31 දින වනවිට භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂය මගින් වෙනත් වැය ශීර්ෂවලට රු.බිලියන 201.29ක් ලබා දී ඇති අතර, ඉන් රු.බිලියන 63.44ක් පුනරාවර්තන වියදම් හා රු.බිලියන 137.85ක් ප්‍රාග්ධන වියදම් සඳහා වේ.

**2.5.2.3 වගුව විසර්ජන පනතේ 6 වන වගන්තිය යටතේ වෙන් කළ ප්‍රතිපාදනවල සාරාංශය**

| | මුද්‍රිත ඇස්තමේන්තුව අනුව අමතර ප්‍රතිපාදන ලබාදීමේ අරමුණ | මුදල (රු.මිලියන) |
|---|---|---|
| 1. | අයවැය කතාවෙන් යෝජිත වැටුප් වැඩි කිරීම, වැටුප් විෂමතා ඉවත් කිරීම, නව බඳවා ගැනීම හා අනෙකුත් අදාළ ගෙවීම් හා රාජ්‍ය අංශයේ විශ්‍රාම වැටුප් වැඩි කිරීම සඳහා වන ප්‍රතිපාදන | 33,969 |
| 2. | අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී වන උපකල්පනයන් මත වන අමතර වියදම් හා අනෙකුත් වගකීම් සඳහා වන ප්‍රතිපාදන | 42,454 |
| 3. | අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රතිපාදන | 5,976 |
| 4. | විදේශීය මූල්‍යනය හරහා අරමුදල් සපයන සංවර්ධන ව්‍යාපෘති සඳහා වන දේශීය අරමුදල් දායකත්වය - බදු හා තීරු බදු ගෙවීම ඇතුළු අදාළ අනෙක් අරමුදල් සැපයීමේ අවශ්‍යතා සඳහා වන ප්‍රතිපාදන | 63,397 |
| 5. | රජයට අයත් සංස්ථාවල ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා බැඳුම්කර නිකුත් කිරීම සඳහා වන ප්‍රතිපාදන | 55,500 |
| | **එකතුව** | **201,296** |

*මූලාශ්‍රයඃ ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### 2.5.3 අයවැය චක්‍රලේඛ නිකුත් කිරීම

වියදම් කරන ආයතනවල වියදම් කළමනාකරණය සඳහා උපදෙස් ලබා දෙමින්, 2015 වර්ෂය තුල ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් පහත චක්‍රලේඛ නිකුත් කරන ලදී.

**2.5.3 වගුව: අයවැය චක්‍රලේඛ නිකුත් කිරීම**

| දිනය | චක්‍රලේඛ අංකය | මාතෘකාව |
|---|---|---|
| 01.01.2015 | 01/2015 | 2015 අයවැය සංශෝධනය - වියදම් දැරීම සඳහා බලය දීම, නව අමාත්‍යාංශ සංයුතිය අනුව සම්පත් බෙදා හැරීම හා ගිණුම් තැබීම |
| 31.03.2015 | 02/2015 | රාජ්‍ය වියදම් කළමනාකරණය - 2015 මූල්‍ය වර්ෂය |
| 24.07.2015 | 03/2015 | 2016 අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ |
| 02.10.2015 | 04/2015 | රාජ්‍ය වියදම් කළමනාකරණය - දින දර්ශන හා දින පොත් මුද්‍රණය |
| 09.12.2015 | 05/2015 | 2015 අයවැය ප්‍රතිශෝධන හා ගිණුම් තැබීම |
| 29.12.2015 | 06/2015 | ජාතික අයවැය මගින් අරමුදල් සපයන ක්‍රියාකාරකම්වල මූල්‍ය හා භෞතික කාර්ය සාධනය අධීක්ෂණය කිරීම |
| 29.12.2015 | 07/2015 | 2016 වර්ෂය තුල වියදම් දැරීම සහා බලය දීම සහ රාජ්‍ය වියදම් කළමනාකරණය |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

## 2.6 අත්තිකාරම් ගිණුම් විමර්ශනය

2015 වසර තුළ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ අත්තිකාරම් ගිණුම්වල ක්‍රියාකාරිත්වය විමර්ශනය අඛණ්ඩ ව සිදු විය. අත්තිකාරම් ගිණුම් 197 තුල රාජ්‍ය සේවකයන් ගේ අත්තිකාරම් ගිණුම් 186 ද වාණිජ අත්තිකාරම් ගිණුම් 4 ද ගබඩා අත්තිකාරම් ගිණුම් 3 ද විශේෂ අත්තිකාරම් ගිණුම් 4 ද ක්‍රියාත්මක විය. අත්තිකාරම් ගිණුම්වල වියදම් සීමාව සඳහා රු.මිලියන 20,728 වෙන් කරන ලදි. විසර්ජන පණතේ විධිවිධාන අනුව ඒ ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල අවශ්‍යතාවය පරිදි රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් 06 ක හා අනෙකුත් අතිතිකාරම් ගිණුම් 06 ක සීමා සංශෝධනය සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර ඇත.

### 3. 2016 සඳහා අයවැය ඇස්තමේන්තු සැකැසීම

රටෙහි ආර්ථික වර්ධනය වේගවත් කිරීමේ රජයේ ඉලක්කය මත පදනම්ව මධ්‍යකාලීන වියදම් රාමුව 2016-2018 තුල 2016 සඳහා අයවැය ඇස්තමේන්තු සකසන ලදී. ඒ අනුව, සියයට 8 ඉක්මවූ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම පිණිස රාජ්‍ය ආයෝජන මධ්‍යකාලීනව අවම වශයෙන් සියයට 6-7 ප්‍රමාණයකින් හෝ වර්ධනය කළයුතු බව 2016 අයවැයෙන් අපේක්ෂා කෙරිනි.

### 3.1 අයවැය සැකසීමේ මාර්ගෝපදේශ

2016 අයවැය කැඳවුම, වාර්ෂික අයවැය ඇස්තමේන්තු සැකසීම සඳහා මාර්ගෝපදේශ හා නියෝගයන් රාජ්‍ය වියදම් පිළිබඳ විස්තරාත්මක විමර්ශනයක් තුලින් ශුන්‍ය පාදක අයවැය සීමා හඳුන්වා දෙමින් නිකුත් කෙරින. ඒ අනුව, ද්විකරණය, අතිපිහිතවීම වැළැක්වීම හා දුර්ලභ සම්පත් කාර්යක්ෂම ලෙස බෙදීයාම සඳහා 2016 සිට ඉදිරියට අයවැය ක්‍රියාවලිය සඳහා ශුන්‍ය පාදක අයවැය ප්‍රවේශය යොදා ගැනීම සඳහා නියෝග ලබාදෙන ලදී.

තාවකාලික ආංශික සීමා නිර්ණය කෙරෙන අතර, ඒ මත පදනම්ව ඒ ඒ අමාත්‍යාංශය සඳහා සීමා නිර්ණය සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් අයවැය සාකච්ඡා සඳහා කැඳවනු ලැබේ. අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතනවල ප්‍රධාන කාර්යයන් හා ක්‍රියාකාරකම් සම්බන්ධ අවසන් ප්‍රතිඵල ළඟා කරගැනීම තහවුරු කරන ලෙස ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මේ මත පදනම්ව භාණ්ඩාගාරය හා අදාළ රේඛීය අමාත්‍යාංශය අතර සාකච්ඡා පැවැත්වීම සඳහා 2015 සැප්තැම්බර් වනවිට ඇස්තමේන්තු කෙටුම්පත් ලබාදෙන ලෙස අමාත්‍යාංශවලින් ඉල්ලා සිටිනු ලැබේ.

## 4. විශේෂ ක්‍රියාකාරකම්

### 4.1 වානිජ නොවන රාජ්‍ය සංස්ථාවල අයවැය කළමනාකරණය

2015 වසර තුල ඒකාබද්ධ අරමුදලින් සහාය සැපයෙන ව්‍යවස්ථාපිත මණ්ඩල 122හි අයවැය කළමනාකරණය පිළිබඳ සියළු කටයුතු ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරිනි. 2014 වසරේදී මෙම ආයතනවල පහත සඳහන් කටයුතු ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ඒවායේ මූල්‍ය හා කළමනාකරණ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම පිණිස සිදු කරන ලදී.

- වාර්ෂික අයවැය, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික ගිණුම් හා වාර්ෂික වාර්තා ආදිය විශ්ලේෂණය මගින් මෙම ව්‍යවස්ථාපිත මණ්ඩලවල කාර්යසාධනය හා ප්‍රගතිය විමර්ශනය කිරීම.
- භාණ්ඩාගාර මෙහෙයුම්වලට අදාළව පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන පිළිබඳ මාසික මුදල් අග්‍රිම නිදහස් කිරීම සම්බන්ධ ඉල්ලීම් පුනරීක්ෂණය.
- 1971 අංක 38 දරන මුදල් පනත අනුව රු.500,000/-ට වැඩි ප්‍රාග්ධන වියදම් සඳහා අනුමැතිය ලබාදීම.
- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ රැස්වීම් පාර්ලිමේන්තුවේදී පැවැත්වෙන විට ඒ සඳහා අවශ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල කාර්යසාධනය හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීම සඳහා සහාය දැක්වීම.
- අවශ්‍ය අවස්ථාවලදී මේ ආයතන සඳහා අවශ්‍ය වාහන මිලදී ගැනීමට අනුමැතිය ලබාදීම හා මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම හා සපයා දීම.
- විගණකාධිපතිගේ විගණන විමර්ශන වාර්තා හා මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන විශේෂ විගණන විමසුම් සමාලෝචනය කිරීම. මෙම විමසුම් විසඳීම පිණිස අදාළ ව්‍යවස්ථාපිත මණ්ඩල සමග සම්බන්ධීකරණය කිරීම හා එවැනි විගණන විමසුම් අනාගතයේ ඇති නොවීමට අවශ්‍ය පියවර ගැනීම.
- අයවැය ප්‍රතිපාදනවල ප්‍රමාණය හා මෙම ආයතනවල සැබෑ අවශ්‍යතාවලට අනුව, ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා නව කාර්ය මණ්ඩල බඳවා ගැනීම පිළිබඳ වූ නිර්දේශ කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- විවිධ අරමුණු සඳහා විදේශ ගමන්වල යෙදීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාදීම (පුහුණු, රැස්වීම්, සම්මන්ත්‍රණ, සාකච්ඡා ආදිය)
- මහා ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආදී වෙනත් මූල්‍ය හා කළමනාකරණ ගැටළු පිළිබඳ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට උපදෙස් දීම හා සම්බන්ධීකරණ කටයුතු

### 4.2 අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳ නිරීක්ෂණ

2015 වසර තුල දෙපාර්තමේන්තුව විසින් ගරු මුදල් අමාත්‍යතුමන්ගේ අමාත්‍ය මණ්ඩල සංදේශ 245ක් සඳහා නිරීක්ෂණ සකස් කරන ලදී.

### 4.3 වාහන මිලදී ගැනීම සඳහා අනුමැතිය

#### 4.3.1 වාහන ප්‍රසම්පාදනය සඳහා ජාතික අයවැය අනුමැතිය ලබාදීම

1990.01.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, රාජ්‍ය ආයතන මගින් වාහන මිලදී ගැනීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව අනුමැතිය ලබාදෙයි. ඒ අනුව, සියළු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන හා සියළු ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා හා රජයට අයත් සමාගම්, ස්වයං මූල්‍ය පාලනයක් ඇත්තේ වුවත්, එවැනි මිලදී ගැනීමක් සඳහා පූර්ව අනුමැතිය ලබාගත යුතුය. ජාතික අයවැය දෙපාර්තමේන්තුව එවැනි ඉල්ලීම් සමාලෝචනය කර, අනුමැතිය ලබාදීම අඛණ්ඩව සිදුකරන ලදී. 2015 වසර තුල වාහන 254 ක් මිලදී ගැනීම සඳහා දෙපාර්තමේන්තුව අවසර ලබා දී ඇත. ඒ ඒ වර්ගය සඳහා මිලදී ගත් වාහන ප්‍රමාණය පහත වගුවේ දැක්වේ.

**4.3.1 වගුව: 2015 වසරේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද වාහන, වාහන වර්ගය අනුව**

| වාහන වර්ගය | අනුමත වාහන සංඛ්‍යාව |
|---|---|
| වෑන් | 12 |
| සින්ගල්/ඩබල්/කෲ කැබ් | 140 |
| ත්‍රීරෝද රථ | 10 |
| ලොරි/ට්‍රක් | 03 |
| යතුරුපැදි | 47 |
| වෙනත් (ට්‍රැක්ටර්/ට්‍රේලර්/වතුර බවුසර් ආදිය) | 42 |
| **එකතුව** | **254** |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### 4.3.2 රාජ්‍ය අංශය සඳහා වාහන ප්‍රසම්පාදනය

2010.08.30 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව, මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ රාජ්‍ය ආයතන සඳහා වාහන මිලදී ගැනීම මගින් රාජ්‍ය වියදම් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමට රජය විසින් උත්සාහ දරන ලදී. මේ ක්‍රමය මුදල් කළමනාකරණයේ කොටසක් වශයෙන් භාවිතා කර ඇති අතර, වාහනයේ පිරිවැය වසර 5 ක් තුල බෙදී යන ආකාරයට දරමින් එය අවසානයේ අදාළ ආයතනයේ වත්කමක් බවට පත්කරන ලදී.

2015 වසර තුල ප්‍රධාන වශයෙන් කාර්, ඩබල් කැබ් හා වෑන් ඇතුළු වාහන 1,343ක් නිදහස් කිරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට හැකි විය. මේ සඳහා කල්බදු කුලී වශයෙන් පමණක් රු.මිලියන 4,547ක් වැය කරන ලදී.

ජාතික අයවැය දෙපාර්තමේන්තුව අදාළ ආයතනය සමග පැවැත්වූ සාකච්ඡාවලින් අනතුරුව, සිදුකරන ලද අවශ්‍යතා තක්සේරුවක් මත පදනම්ව මේ වාහන රාජ්‍ය ආයතන අතර බෙදාදෙන ලදී.

### 4.4 මණ්ඩල හා කමිටු සඳහා කාර්ය මණ්ඩලය සහභාගී වීම

මෙම දෙපාර්තමේන්තුවේ සිටින මාණ්ඩලික නිලධාරීන් ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය සංස්ථා හා රජයට අයත් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලවල අධ්‍යක්ෂවරුන් වශයෙන් (භාණ්ඩාගාර නියෝජිතයින්) සේවය කරන අතර, ඇතැම් නිලධාරීහු භාණ්ඩාගාර ලේකම් නියෝජනය කරමින් අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන මණ්ඩල, තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයින් වශයෙන් සේවය කරති. ඊට අමතරව, මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීහු දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් රාජ්‍ය ගිණුම් කාරක සභාවේ හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ රැස්වීම්වලට සහභාගී වෙති.

## 5. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය හා කාර්යභාරය

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය හා කාර්යභාරය සකස් වී ඇත්තේ රේඛීය අමාත්‍යාංශවල වියදම් ඇස්තමේන්තු ප්‍රතිපාදන නියෝජනය කරන්නා වූ පහත අංශ යටතේ වූ වර්ගීකරණයක් මගිනි.

1. රාජ්‍ය සේවා
2. ජාතික ආරක්ෂාව හා නීතිය ක්‍රියාත්මක කිරීම
3. මානව සම්පත්
4. යටිතල පහසුකම්
5. මුදල්
6. සමාජ ආරක්ෂණ
7. පරිසරය
8. තථ්‍ය ආර්ථිකය

5.1 **කාර්ය මණ්ඩලය**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව, 2015 වර්ෂය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහයට පහත මට්ටම්වලට අයත් නිලධාරී සංඛ්‍යාවන් අයත් විය.

| **සේවා මට්ටම** | **නිලධාරීන් සංඛ්‍යාව** |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 38 |
| තෘතීය මට්ටම | 04 |
| ද්විතීය මට්ටම | 75 |
| ප්‍රාථමික මට්ටම | 38 |

2015 වසර අවසාන වන විට දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව හා සැබෑ සේවක සංඛ්‍යාව පහත පරිදි විය.

**5.1 වගුව: 2015 වසරේ සේවක සංඛ්‍යාව**

| **තනතුර** | **අනුමත සේවක සංඛ්‍යාව** | **සැබෑ සේවක සංඛ්‍යාව** |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 02 | 01 |
| අධ්‍යක්ෂ | 14 | 11 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ } සහකාර අධ්‍යක්ෂ | 20 | 15 |
| ගණකාධිකාරී | 01 | 00 |
| පරිපාලන නිලධාරී | 01 | 01 |
| භාෂා පරිවර්තක | 02 | 01 |
| තොරතුරු තාක්ෂණ නිලධාරී | 01 | 00 |
| ව්‍යාපෘති නිලධාරී | 04 | 00 |
| අයවැය සහකාර | 38 | 28 |
| පර්යේෂණ සහකාර | 01 | 01 |
| සංවර්ධන සහකාර | 09 | 08 |
| කළමනාකරණ සහකාර | 23 | 23 |
| රියදුරු | 16 | 16 |
| කා.කා.ස. | 22 | 19 |
| | ---------- | --------- |
| **එකතුව** | **155** | **125** |
| | ====== | ===== |

## 5.2 මානව සම්පත් සංවර්ධනය

2015 වසරේදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තම රාජකාරි මට්ටමින් සහභාගී වූ විවිධ රැස්වීම්වලට අමතරව, ඔවුන්ගේ වෘත්තීය නිපුණතා හා වැඩ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම පිණිස පහත දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා සහභාගී කරවන ලදී.

### 5.2.1 විදේශීය පුහුණු/සම්මන්ත්‍රණ/රැස්වීම්

2015 වසරේදී පහත මාණ්ඩලික නිලධාරීන්ට විවිධ ක්ෂේත්‍රවල විදේශීය පුහුණුව ලබාදෙන ලදී.

| අනු අං. | නිලධාරියාගේ නම | තනතුර | වැඩසටහන | රට | කාලය |
|---|---|---|---|---|---|
| 1 | කේ.පී.කේ.විමලවීර මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 48 වැනි ජනගහණ හා සංවර්ධන කොමිසම | නිව්යෝර්ක් | 2015.04.13- 2015.04.17 |
| 2 | වයි.පී.සුමනා මිය | අධ්‍යක්ෂ | ආර්ථික ගෝලීයකරණය හා සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා චීන නිෂ්පාදන පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | 2015.05.21- 2015.06.10 |
| 3 | ඒ.එච්.එස්.ගුණවර්ධන මයා | අධ්‍යක්ෂ | ADB-OECD ආපදා කළමනාකරණය පිළිබඳ අන්‍යොන්‍ය කටයුතු | පිලිපීනය හා මැලේසියාව | 2015.09.15- 2015.09.16 2015.09.17- 2015.09.18 |
| 4 | එම්.අනෝමා නන්දනී මිය | අධ්‍යක්ෂ | ආසියා පැසිෆික් රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ජාල ආරම්භක සම්මන්ත්‍රණය | පිලිපීනය | 05.10.2015- 06.10.2015 |
| 5 | බියන්කා එන්.ගමගේ මිය | අධ්‍යක්ෂ | ආසියාව සඳහා ජපාන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ක්ෂුද්‍ර ආර්ථික විද්‍යා සම්මන්ත්‍රණය - 2015 | ජපානය | 2015.02.21 - 2015.02.28 |
| 6 | නාලනී අමරතුංග මිය | අධ්‍යක්ෂ | ආසියා රටවල් සඳහා ඒකාබද්ධ ග්‍රාමීය, නාගරික සංවර්ධන හා දිළිඳු බව අඩු කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | 2015.06.04 - 2015.06.18 |
| 7 | අජිතා බටගොඩ මිය | අධ්‍යක්ෂ | ආසියාවේ ආදායම් විෂමතාව හා පරිපූර්ණ මූල්‍යය | ඉන්දුනීසියාව | 11.11.2015 - 12.11.2015 |
| 8 | ඒ.ජී.නිශාන්ත මයා | අධ්‍යක්ෂ | ඉහළ මට්ටමේ ජලාශ්‍රිත කටයුතු, සංවර්ධනය සඳහා මූල්‍යනය | ඉතියෝපියාව | 2015.07.15 |
| 9 | කේ.එම්.රිස්වි මයා | සහකාර අධ්‍යක්ෂ | උසස් කළමනාකරණය පිළිබඳ අභ්‍යන්තර වැඩසටහන, AIT බැංකොක් | තායිලන්තය | 23.11.2015 - 29.11.2015 |

**5.2.2 දේශීය පුහුණු**

2015 වසරේදී පහත නිලධාරීන්ට විවිධ ක්ෂේත්‍රවල දේශීය පුහුණුව ලබාදෙන ලදී.

| | නම | තනතුර | පුහුණුව | ආයතනය | කාලය |
|---|---|---|---|---|---|
| 1 | එම්.එම්.ටී.පී.එස්. පෙරේරා මිය | කළමනාකරණ සහකාර | රජයේ දේපළ පිළිබඳ වැඩසටහන | PRAG ආයතනය | 2015.02.12 |
| 2 | එස්.ඩී.එස්.ප්‍රනාන්දු මිය | පරිපාලන නිලධාරී | කාර්යාල කළමනාකරණ ඩිප්ලෝමා වැඩසටහන | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2015-2016 |
| 3 | එම්.එෆ්.කේ. නිසා මිය | සහකාර අධ්‍යක්ෂ | රාජ්‍ය කළමනාකරණ ශාස්ත්‍රපති උපාධි වැඩසටහන | කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය | 2015-2017 |
| 4 | එම්.ලොකුබාලසූරිය මයා<br>ඒ.ඩී.රන්මාලි මෙය. | කළමනාකරණ සහකාර<br>අයවැය සහකාර | පරිගණක දෘඩාංග පිළිබඳ පුහුණුව | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | 2015.08.10- 2015.08.11 |
| 5 | එස්.අබයසිරි මිය<br>එම්.පෙරේරා මිය | කළමනාකරණ සහකාර | පරිගණක දෘඩාංග පිළිබඳ පුහුණුව | තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | 2015.08.25- 2015.08.26 |

### 5.3. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන 2015 අයවැය ඇස්තමේන්තුවල 240 ශීර්ෂය යටතේ දක්වෙයි. අයවැය ප්‍රතිපාදන වැඩසටහන් දෙකක් යටතේ ලබාදෙයි.

| | | |
|---|---|---|
| (අ) | වැඩසටහන<br>වැඩසටහනේ 01 වන ව්‍යාපෘතිය | 01 - මෙහෙයුම් කටයුතු<br>01 - අයවැය සැකසීම හා ප්‍රතිපත්ති |
| (ආ) | වැඩසටහන<br>වැඩසටහනේ 02 වන ව්‍යාපෘතිය | 02 - සංවර්ධන කටයුතු<br>02 - පරිපූරක සහායක සේවා හා අවිනිශ්චිත අවස්ථා වගකීම් |

01 වන ව්‍යාපෘතිය මඟින් අයවැය සැකසීම හා ප්‍රතිපත්ති පිළිබඳ දෙපාර්තමේන්තු පරිපාලන වියදම් සඳහා ප්‍රතිපාදන ලබාදෙන අතර, 02 වන ව්‍යාපෘතිය මඟින් විවිධ වියදම් කරන ආයතනවලට අවශ්‍ය වන පෙර නුදුටු හා අනපේක්ෂිත වියදම්, 2015 අයවැය කතාවේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වියදම් හා මුදල් වර්ෂයේ ප්‍රකාශිත ප්‍රතිපත්ති ප්‍රමුඛතා සඳහා වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන ලබාදෙයි.

2015 මුල් ඇස්තමේන්තුවල වැය ශීර්ෂවලින් හඳුනාගත් ඉතිරි කිරීම්වලින් හා අයවැය යෝජනා නීතිගත වීමෙන් අනතුරුව රු. 216,563,628,000 ක මුදලක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙනුවෙන් ලබාදෙන ලදී.

ඉහත මුළු ප්‍රතිපාදන පහත පරිදි භාවිතයට ගැනිණි.

| | | |
|---|---|---|
| (1) | 1 වන වැඩසටහනේ 01 වන ව්‍යාපෘතියේ වියදම් | 6,901,991,025 |
| (2) | 2 වැඩසටහනේ 02 වන ව්‍යාපෘතිය යටතේ අනෙක් ශීර්ෂවලට මාරු කරන ලද ප්‍රතිපාදන | 201,296,120,217 |
| | **එකතුව** | **208,198,111,242** |
| | **ඉතිරි ප්‍රතිපාදන** | **8,365,516,758** |

#### 5.3.1 අත්තිකාරම් ගිණුම් කටයුතු

**5.3.1 වගුව: 2015 සඳහා රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් ගිණුම්**

| **වර්ගය** | **2015 සඳහා අනුමත සීමාව** රු. | **තථ්‍ය ප්‍රමාණය** 2015 රු. |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | 5,500,000.00 | 5,275,649.00 |
| උපරිම ලැබීම් සීමාව | 3,800,000.00 | 4,301,530.00 |
| උපරිම ණය ශේෂ සීමාව | 27,000,000.00 | 19,874,163.26 |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

2003.12.31 අංක 114 චක්‍රලේඛයට අනුව, ඉහත වගුවේ දත්ත මගින් දක්වෙන්නේ දෙපාර්තමේන්තුව තුල අත්තිකාරම් ගිණුම් අංක 240-110 යටතේ කළ ගණුදෙනු පමණි. චක්‍රලේඛ අංක 118 අනුව බාහිරට හෝ තුලට මාරුවීම් ලද නිලධාරීන්ගේ ණය ශේෂයන් අත්තිකාරම් ගිණුම් අංක 240-012 ගිණුම් ශීර්ෂ යටතේ නිරාකරණය කර ඇත. මේ ණය ශේෂයන් පියවීම සම්බන්ධව 2015 වසර තුල වූ වියදම රු. 6,309,464.00 ක් වූ අතර, ලැබීම් රු. 5,972,857.50 විය. ඒ අනුව, දෙපාර්තමේන්තුව රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ අනුමත සීමාව හා අනුගත වී ඇත.

**5.3.2 වගුව: 2015 වසරේදී ලබා දුන් ණය**


| ණය/අත්තිකාරම් | ලබා දුන් ණය ප්‍රමාණය | මුදල රු. |
|---|---|---|
| උත්සව අත්තිකාරම් | 82 | 820,000 |
| විශේෂ අත්තිකාරම් | 58 | 232,400 |
| ආපදා හා බයිසිකල් ණය | 88 | 4,223,249 |
| **එකතුව** | **228** | **5,275,649** |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

### 5.3.2 2015 සඳහා විගණකාධිපතිගේ විමසුම්

2015 වසර තුල මෙම දෙපාර්තමේන්තුව වෙත විගණකාධිපති විසින් විමසුම් 12 යොමුකර ඇති අතර, ඒ සියළු විමසුම් සඳහා නිසි පරිදි පිළිතුරු ලබාදී ඇත.

<u>**සංවිධාන සැලැස්ම - ජාතික අයවැය දෙපාර්තමේන්තුව (අනුමත කාර්යයමණ්ඩලය අනුව)**</u>




අති.අ.ජ. - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
අ - අධ්‍යක්ෂ
නිඅ - නියෝජ්‍ය අධ්‍යක්ෂ
සඅ - සහකාර අධ්‍යක්ෂ

ගණක - ගණකාධිකාරී
භාප - භාෂා පරිවර්තක
පරිනි - පරිපාලන නිලධාරී
තානි - තොරතුරු තාක්ෂණ නිලධාරී

අස - අයවැය සහකාර,සංවර්ධන නිලධාරී
කල.ස - කලමනාකරණ සහකාර
කාකාස - කාර්යාල කාර්යය සහායක